# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

මුදල් චක්‍රලේඛ ලිපි අංක . 01/2019

2019 ජනවාරි මස 02 වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂකවරුන්

<u>අතුරු සම්මත ගිණුම - 2019</u>
<u>ශීර්ෂ අංක.214 - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව</u>

2019 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන තුරු, රජයේ සාමාන්‍ය සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අතුරු සම්මත ගිණුමක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදි.
අතුරු සම්මත ගිණුම හරහා වියදම් අවසරය ලබා දී ඇත්තේ 2018 වර්ෂයේ ඇස්තමේන්තුවට ඇතුළත් වන 2019 වර්ෂය තුළ තවදුරටත් ක්‍රියාත්මක වන වැඩසටහන්, ව්‍යාපෘති සහ විෂය කේත සඳහා පමණක් වේ. එබැවින් නව කාර්ය මණ්ඩල, නව සැපයුම් හා සේවාවන්, ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘති සඳහා වන වියදම් දැරිය යුත්තේ 2019 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත අනුමත කළ පසුව බව අවධාරණය කරනු ලැබේ.

**අතුරු සම්මත ගිණුම් සාරාංශය -2019**

**(රු.මිලියන)**

| කාණ්ඩය/ විෂය මාතෘකාව | **2018 සංශෝධිත අයවැය 2018.11.31 දක්වා** | **2018 නොවැම්බර් 30 දක්වා** තථ්‍ය වියදම් | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරිපත් කළ ඇස්තමේන්තු **2019** | අතුරු සම්මත ගිණුම **2019** |
|---|---|---|---|---|
| පුනරාවර්තන ප්‍රදාන | 34,171 | 32,777 | 48,830 | 15,208 |
| ප්‍රාග්ධන ප්‍රදාන | 19,454 | 13,466 | 31,689 | 4,600 |
| **එකතුව** | **53,625** | **46,243** | **80,519** | **19,808** |

ජනවාරි-අප්‍රේල් 2019 (අතුරු සම්මත ගිණුම) සඳහා විශ්වවිද්‍යාල වශයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම, පුනරාවර්තන ප්‍රදාන (ඇමුණුම -I) සහ ප්‍රාග්ධන ප්‍රදාන (ඇමුණුම - II) හි දක්වා ඇත.

1. **අයවැය සකස් කිරීම - අතුරු සම්මත ගිණුම 2019**

SDG අංක 4 - ගුණාත්මක අධ්‍යාපනය මත පදනම්ව නිර්මාණය කරන ලද ප්‍රධාන ප්‍රතිපත්ති ක්ෂේත්‍ර හතරට අනුකූලව, ඉහත කාලසීමාව සඳහා අයවැය සකස් කිරීමට විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ.

- උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය
- උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා අදාළත්වය
- කළමනාකරණ පද්ධතීන්හි ප්‍රමාණවත් බව
- පර්යේෂණ, නවෝත්පාදන හා දැනුම හුවමාරු කිරීම

අතුරු සම්මත ගිණුම සඳහා අයවැය ඇස්තෙමේන්තු සකස් කිරීමේ දී අනුගමනය කළ යුතු ආකෘතිය මෙම චක්‍රලේඛයේ ආකෘති I-VI හි දක්වා ඇත.

2. **ප්‍රාග්ධන ප්‍රදාන (CBG)**

අරමුදල් උපයෝගී කර ගැනීමේ ප්‍රගතිය හා විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයෝජන සැලැස්ම සැලකිල්ලට ගනිමින් විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රාග්ධන ප්‍රදාන වෙන්කර ඇත.

**අ) ඉදි කිරීම් ව්‍යාපෘති**

<u>දැනට සිදුකරන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතා පදනම මත අරමුදල් වෙන් කළ යුතු අතර, 2019 ජනවාරි-අප්‍රේල් කාල සීමාව තුළ නව ඉදිකිරීම් ව්‍යාපෘති ආරම්භ නොකළ යුතුය.</u>

**ආ) වෙනත් සංවර්ධන ව්‍යාපෘති**

ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම, ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම, මානව ප්‍රාග්ධන සංවර්ධනය සහ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතා පදනම මත විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන මගින් ප්‍රමාණවත් පරිදි අරමුදල් වෙන් කර ගත යුතුය.

**ඇ) ඉඩම් සහ වාහන අත්කර ගැනීම**

ප්‍රාග්ධන ප්‍රදානවලින් ඉඩම් සහ වාහන මිලදී ගැනීම් සඳහා අරමුදල් වෙන් නොකළ යුතුය. ඉඩම් සහ වාහන මිල දී ගැනීම් සඳහා පවත්නා චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතුය.

**ඇ) පශ්චාත් උපාධි / ආචාර්ය උපාධි පාඨමාලා**

විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි / ආචාර්ය උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS) විසින් ප්‍රතිපාදන සපයනු ලබන අතර විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන මෙම කාර්යය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන මගින් මුදල් වෙන් නොකළ යුතුය. විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් පවත්වනු ලබන පශ්චාත් උපාධි වැඩසටහන් පශ්චාත් උපාධි ව්‍යාපෘතිවලින් උත්පාදනය කරන ලද ආදායමෙන් මූල්‍යනය කළ යුතුය.

**3. 2016-2018 අයවැය යෝජනා ඉදිරියට ගෙන යාම**

2016-2018 අයවැය යෝජනා මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අරමුදල් වෙන් කරනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ ව්‍යාපෘතිවල කාර්ය සාධනය පදනම් කර ගනිමින්, ජනවාරි - අප්‍රේල් කාල සීමාව තුළ අරමුදල් මුදාහැරීම පිළිබඳව සලකා බලනු ලැබේ.

අ) විශ්වවිද්‍යාලවල තාක්ෂණ පීඨ පිහිටුවීම - රු.මි. 932

ආ) වෛද්‍ය පීඨය පිහිටු වීම - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - රු.මි.150

ඇ) ජාත්‍යන්තර කීර්තිමත් වෘත්තීය ආයතන සමග ප්‍රතිතනය දිරිමත් කිරීම - රු.මි. 4.5

ඇ) දත්ත විද්‍යාව, දත්ත විශ්ලේශනය, ආයුගණක අධ්‍යයන ව්‍යාපාර විශ්ලේශනය සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම - කොළඹ විශ්වවිද්‍යාලය - රු.මි.70.5

ඉ) නවීන පහසුකම් සහිත පුස්තකාලයක් හා තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම - වව්නියා මණ්ඩපය - රු.මි 60

<u>ඉහත අංක 03 (අ) සිට (ඉ) හි දක්වා ඇති ප්‍රතිපාදන යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නව ව්‍යාපෘති මූල්‍යනය කරනු නොලැබේ.</u>

**4. ආසියානු සංවර්ධන බැංකු ආධාර ව්‍යාපෘති**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, සබරගමු විශ්වවිද්‍යාලයේ සහ කැළණිය විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨ ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කිරීමට යෝජනා කර ඇත. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් සමඟ සාකච්ඡා කරන ලෙස අදාළ විශ්වවිද්‍යාලවලට උපදෙස් දෙනු ලැබේ.

**5. පුනරාවර්තන වියදම් ප්‍රදාන (RBG)**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කළ අරමුදල් ක්‍රමවේදය සහ විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන මගින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු මත පදනම්ව, ජනවාරි - අප්‍රේල් 2019 සඳහා පුනරාවර්තන වියදම් ප්‍රදාන ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් වෙන් කර ඇත.

**6. සිසුන්ගේ ශිෂ්‍යාධාර හා මහපොළ සඳහා අරමුදල් ලබා දීම - භාණ්ඩාගාර දායකත්වය**

දැනට පවතින චක්‍රලේඛ මගින් නියම කර ඇති පරිදි ශිෂ්‍යාධාර ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමේ ඉල්ලීම් මාසිකව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ.

මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම සහ මහපොල ශිෂ්‍යත්ව සඳහා වන භාණ්ඩාගාරයේ දායකත්ව මුදල් නිදහස් කිරීම සඳහා උපදෙස්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / මහපොළ භාර අරමුදල විසින් නියමිත කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

මේ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීම් අවශ්‍ය නම් කරුණාකර 011-2123485 යන දුරකථන අංකයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී මගින් ලබා ගත හැකිය.

**7. පශ්චාත් උපාධි ආයතන සඳහා අරමුදල්**

උත්පාදිත ආදායමෙන් අයවැය මූල්‍යනය කිරීමට පශ්චාත් උපාධි ආයතනවලට මෙයින් උපදෙස් දෙනු ලැබේ. ප්‍රාග්ධන ව්‍යාපෘති අධීක්ෂණ කමිටුව නිර්දේශ කරන ලද මධ්‍ය කාලීන වැඩසටහන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය පදනම් කර ගනිමින් ප්‍රාග්ධන අරමුදල් වෙන් කරනු ලැබේ.

පශ්චාත් උපාධි ආයතනය සඳහා පුනරාවර්තන වියදම් ප්‍රදාන වෙන් කිරීම සිදු කරනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති ඔවුන්ගේ ස්ථිර සේවක සංඛ්‍යා තනතුරු මත පදනම් වේ.

කෙසේ වෙතත්, පශ්චාත් උපාධි ආයතන වසර 2020 වන විට ස්වයං මූල්‍යකරණය කළ යුතු අතර, ඒ සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම සඳහා කටයුතු කළ යුතුය.

**8. පොදු මාර්ගෝපදේශ**

අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8(2)(ආ) වගන්තිය ප්‍රකාරව, රු.500, 000/- ට වැඩි ප්‍රාග්ධන වියදමක් දැරීමට පෙර මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය සහ රේඛීය අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගත යුතුය. එබැවින්, විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල අයවැය සහ ප්‍රාග්ධන වියදම් වැඩසටහන සඳහා ගරු මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන මෙන් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ.

ආ) කරුණාකර **ආකෘතිය I-VI අනුව සකස් කරන ලද අයවැය ලේඛනයේ මෘදු පිටපත** 2019 ජනවාරි මස 07 දින හෝ ඊට පෙර **budget@ugc.ac.lk** විද්‍යුත් ලිපිනයට යොමු කරන්න.

ඇ) අයවැය ලේඛනයේ දෘඩ පිටපතක් හා එහි තවත් පිටපතක්, අධ්‍යක්ෂ ජෙනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය යන ලිපිනය වෙත 2019 ජනවාරි මස 07වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කරන මෙන් ඔබෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ඈ) කුමන හේතුවක් යටතේ වුවද, විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන විසින් සම්මත ආකෘති වෙනස් නොකළ යුතුය.

ඉ) මෙම චක්‍රලේඛය හා ඒ සමඟ ඇති සියලුම ඇමුණුම් **www.ugc.ac.lk** මගින් බාගත කර ගත හැකිය.

ඊ) මේ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නේ නම් කරුණාකර 011-2685021 යන දුරකථන අංකයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී හෝ 011-2123490 යන දුරකථන අංකයෙන් ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී/අයවැය විමසන මෙන් දැනුම් දෙමු.

අ.කළේ **මහාචාර්ය මොහාන් ද සිල්වා**
සභාපති

පිටපත් :

1. ලේකම්/ නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. අධ්‍යක්ෂ ජෙනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව
3. උප සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

5. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්/ මණ්ඩප/ ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් / සහකාර ලේඛකාධිකාරීවරුන්

6. ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

7. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්/ මණ්ඩප/ ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්

8. ඉංජිනේරු/ යටිතල පහසුකම් සංවර්ධන අංශය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

9. ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

10. අභ්‍යන්තර විගණක/විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

11. විගණකාධිපති

12. රජයේ විගණක අධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

13. විශ්වවිද්‍යාල රජයේ විගණක අධිකාරීවරුන්

ඇමුණුම I

**අතුරු සම්මත ගිණුම -2019**

**ශීර්ෂය - 214 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

**සාරාංශය - පුනරාවර්තන ප්‍රදාන**

| | විශ්වවිද්‍යාලය/ආයතනය | ජනවාරි- අප්‍රේල් 2019<br>රු.'000 |
|---|---|---|
| 1 | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 2,347,000 |
| 2 | කොළඹ විශ්වවිද්‍යාලය | 1,390,000 |
| 3 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 1,340,000 |
| 4 | කැලණිය විශ්වවිද්‍යාලය | 1,290,000 |
| 5 | මොරටුව විශ්වවිද්‍යාලය | 933,000 |
| 6 | යාපනය විශ්වවිද්‍යාලය / වව්නියා මණ්ඩපය | 1,066,000 |
| 7 | රුහුණ විශ්වවිද්‍යාලය | 1,467,000 |
| 8 | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 550,000 |
| 9 | නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 494,000 |
| 10 | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 376,000 |
| 11 | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 585,000 |
| 12 | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 527,000 |
| 13 | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 480,000 |
| 14 | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 286,000 |
| 15 | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 343,000 |
| 16 | ත්‍රිකුණාමලය මණ්ඩපය | 110,000 |
| 17 | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 47,000 |
| 18 | කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය | 20,000 |
| 19 | පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 27,000 |
| 20 | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 6,000 |
| 21 | පාලි හා බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය | 20,000 |
| 22 | කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය | - |
| 23 | ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය | 8,000 |
| 24 | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 11,000 |

| | | |
|---|---|---|
| 25 | දේශීය වෛද්‍ය විද්‍යායතනය | 170,000 |
| 26 | මානව සම්පත් අභිවර්ධන ආයතනය | 27,000 |
| 27 | කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය | 115,000 |
| 28 | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | 107,000 |
| 29 | මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික විද්‍යායතනය | 135,000 |
| 30 | ජාතික පුස්තකාල හා විඥාපන අධ්‍යයන ආයතනය | 6,000 |
| 31 | ජෛව රසායන, අනුක ජෛව විද්‍යා හා ජෛව තාක්ෂණ ආයතනය | 24,000 |
| 32 | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයනායතනය | 80,000 |
| 33 | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය | 6,000 |
| 34 | කොළඹ විශ්වවිද්‍යාලීය කෘෂි - තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය | 15,000 |
| 35 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 800,000 |
| | එකතුව | 15,208,000 |

ඇමුණුම II

# අතුරු සම්මත ගිණුම -2019
# ශීර්ෂය - 214 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
# සාරාංශය - ප්‍රාග්ධන ප්‍රදාන

| | විශ්වවිද්‍යාලය/ආයතනය | ජනවාරි- අප්‍රේල් 2019<br><br>රු.'000 |
|---|---|---|
| 1 | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 275,000 |
| 2 | කොළඹ විශ්වවිද්‍යාලය | 250,000 |
| 3 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 240,000 |
| 4 | කැලණිය විශ්වවිද්‍යාලය | 250,000 |
| 5 | මොරටුව විශ්වවිද්‍යාලය | 240,000 |
| 6 | යාපනය විශ්වවිද්‍යාලය / වව්නියා මණ්ඩපය | 270,000 |
| 7 | රුහුණ විශ්වවිද්‍යාලය | 200,000 |
| 8 | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 30,000 |
| 9 | නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 150,000 |
| 10 | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 120,000 |
| 11 | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 210,000 |
| 12 | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 180,000 |
| 13 | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 150,000 |
| 14 | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 135,000 |
| 15 | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 120,000 |
| 16 | ත්‍රිකුණාමලය මණ්ඩපය | 135,000 |
| 17 | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 128,000 |
| 18 | කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය | 5,000 |
| 19 | පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 5,000 |
| 20 | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 10,000 |
| 21 | පාලි හා බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය | 25,000 |
| 22 | කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය | - |
| 23 | ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය | - |
| 24 | මානව ශස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 5,000 |

| | | |
|---|---|---|
| 25 | දේශීය වෛද්‍ය විද්‍යායතනය | 12,000 |
| 26 | මානව සම්පත් අභිවර්ධන ආයතනය | 3,000 |
| 27 | කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය | 30,000 |
| 28 | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | 41 ,000 |
| 29 | මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික විද්‍යායතනය | 3,000 |
| 30 | ජාතික පුස්තකාල හා විඥාපන අධ්‍යයන ආයතනය | 500 |
| 31 | ජෛව රසායන, අනුක ජෛව විද්‍යා හා ජෛව තාක්ෂණ ආයතනය | 4,000 |
| 32 | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයනායතනය | 15,000 |
| 33 | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය | 19,500 |
| 34 | කොළඹ විශ්වවිද්‍යාලීය කෘෂි - තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය | 9,500 |
| 35 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 112,500 |
| | විශ්වවිද්‍යාලවල තාක්ෂණ පීඨ පිහිටුවීම | 932,000 |
| | නව පාඨමාලා හඳුන්වා දීම සඳහා යටිතල පහසුකම් සැපයීම (වෛද්‍ය පීඨය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය (1 අදියර) | 150,000 |
| | ජාත්‍යන්තර කීර්තිමත් වෘත්තීය ආයතන සමග ප්‍රතීතනය දිරිමත් කිරීම | 4,500 |
| | දත්ත විද්‍යාව, දත්ත විශ්ලේශනය, ආයුගණක අධ්‍යයන ව්‍යාපාර විශ්ලේශනය සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම - කොළඹ විශ්වවිද්‍යාලය | 70,500 |
| | නවීන පහසුකම් සහිත පුස්තකාලයක් හා තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම - වව්නියා මණ්ඩපය | 60,000 |
| | එකතුව | **4,600,000** |